# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 3 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

**මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

**සංස්කෘත භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0505-8

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

## පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළැපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම  ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා  නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි .එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්‍ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්‍ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412’5’12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පන්ති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **අධීක්‍ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**විෂය විශේෂඥ උපදේශනය** : මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය** : පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය හසලක සෝමරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
කො/ විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය

පූජ්‍ය මාර්තුපිටියේ මෙත්තාරාම හිමි
ගුරු උපදේශක, කළු/ ශ්‍රී ධම්මරතන මූලික පිරිවෙණ,
හොරණ

පූජ්‍ය මීගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති, ගම්/ ශ්‍රී ධීරානන්ද විද්‍යායතන
පිරිවෙණ, තැඹිලිගස්මුල්ල, මාකොළ

එච්. එම්. ජයන්ත හේරත්
පරිවේණාචාර්ය, මාර/ශ්‍රී රතනපාල මහ පිරිවෙණ
කොටුව, මිගදාය, මාතර

**භාෂා හා විෂය කරුණු සංස්කරණය** : මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| **සෝදුපත් කියැවීම** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | පූජ්‍ය රූපහ ඤාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ගම්/ ශාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම |
| | | පූජ්‍ය අබේසේකරගම විජිත හිමි<br>පරිවේණාධිපති, ගා/ ශ්‍රී රේවත මහ පිරිවෙණ<br>කුඹල්වැල්ල, ගාල්ල |
| | | පූජ්‍ය නෙල්ලිවල සිරිනන්ද හිමි<br>පරිවේණාචාර්ය<br>ගම් / ශ්‍රී සුදර්ශන ධර්මායතන මූලික පිරිවෙණ<br>තිඹිරිගම, කිරිඳිවැල |
| | | ඩබ්. ලසන්ත කුමාර<br>පරිවේණාචාර්ය, ගම්/පද්මාවතී මහ පිරිවෙණ<br>කැරගල, හේනේගම |
| **පිටකවර නිර්මාණය** | : | ජේ. එම්. තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විවිධ සහාය** | : | පී. ජී. බී. බුද්ධිකා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙනගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගනිමිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| ජාතික අරමුණු | xvi |
| මූලික නිපුණතා | xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xx |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxi |
| විෂය නිර්දේශය | xxiii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxv |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | |
| පාඩම 1 - දේවනාගරී අක්‍ෂරමාලාව | 3 |
| පාඩම 2 - දේවනාගරී අක්‍ෂරමාලාව | 7 |
| පාඩම 3 - නාමපද | 13 |
| පාඩම 4 - ආඛ්‍යාතපද | 17 |
| පාඩම 5 - සන්ධි | 23 |
| පාඩම 6- සමාස | 32 |
| පාඩම 7 - තද්ධිත | 38 |
| පාඩම 8 - කෘදන්ත | 41 |
| පාඩම 9 - වාක්‍ය නිර්මාණය | 47 |
| පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත නාම වරනැගිල්ල | 52 |
| පාඩම 11 - නිර්දිෂ්ටග්‍රන්ථ - ව්‍යාසකාරය | 56 |
| පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - ප්‍රථමාදර්ශය | 58 |
| පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 3 | 60 |
| පාඩම 14 - හිතෝපදේශය | 63 |
| ඇගයීම හා තක්සේරුකරණය | 65 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවයශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

## සංස්කෘත භාෂාව

## විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 03 | I | 1.1, 1.2, 2.1, 3.1, 3.2 9.1, 9.2, 9.3, 10.1, 10.2 | 60 |
| | II | 3.2, 4.1, 5.1, 6.1, 7.1, 8.1, 9.1, 10.1, 10.2 | 60 |
| | III | 5.1, 6.1, 7.1, 8.1, 9.1, 9.2, 9.3, 10.1, 10.2 | 55 |
| | | එකතුව | 175 |

# संस्कृतपाठ्यक्रमः

**සංස්කෘත විෂය නිර්දේශය**

## 3 ශ්‍රේණිය

# आचितोऽति च शास्त्रार्थं - आचारे स्थापयत्यपि ।
# स्वयमप्याचरेद्यस्तु - स आचार्य इतिस्मृतः ॥

යමෙක් විද්‍යාශාස්ත්‍ර අර්ථයෙන් දැනුම රැස් කරන්නේ ද, අන්‍යයන් ආචාර ධර්මයෙහි පිහිටුවන්නේ ද,

එසේ ම තමනුත් එම ආචාරයෙහි හැසිරෙන්නේ ද, ඔහු 'ආචාර්ය' නම් වෙයි.

## වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධිපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාසපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්තපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 දේවනාගරී අක්‍ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | 1.1 දේවනාගරී අක්‍ෂරමාලාවේ ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද භාවිත කරයි. | 1.1.1 ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද<br>• ප්‍රභේද අටකින් යුත් ස්වරාක්‍ෂර<br>• හ්‍රස්ව<br>• දීර්ඝ<br>• ප්ලුත<br>• සමානාක්‍ෂර<br>• සන්ධ්‍යක්‍ෂර<br>• සවර්ණ<br>• නාමින්<br>• අනාමින් | 1.1.1<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අට නිදසුන් සහිත ව පහදයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර එහි ප්‍රභේද අටට වෙන්කර ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි. | 15 |
| | | 1.1.2 ප්‍රභේද දහ දොළහකින් යුත් ව්‍යඤ්ජනාක්‍ෂර<br>• වර්ගාක්‍ෂර<br>• අඝෝෂ<br>• ඝෝෂ<br>• අල්ප ප්‍රාණ<br>• මහාප්‍රාණ<br>• වර්ගමූල<br>• වර්ගාන්ත<br>• අනුනාසික්‍ය<br>• අන්තඃස්ථ<br>• ඌෂ්මන්<br>• අනුස්වාර<br>• විසර්ග | 1.1.2<br>දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර එහි ප්‍රභේද දොළහට වෙන්කොට ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.2 දේවනාගරී අක්‍ෂරමාලාවේ උත්පත්තිස්ථාන පෙන්වා දෙයි. | 1.2<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .......... යනාදි පාඨය | 1.2<br>• අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨ කටපාඩමින් ප්‍රකාශ කරයි; ලියයි.<br>• සංස්කෘත භාෂාවෙන් දැක්වෙන අක්ෂර උප්පත්ති ස්ථාන සිංහලෙන් හඳුන්වා දෙයි.<br>• අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨවලට අයත් අකුරු සියල්ල ලියා පෙන්වයි. | |
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 සර්ව නාම නිවැරදි ව භාවිත කරයි. | 2.1.1 සර්වනාම<br>• සර්වනාම සරල ව හැඳින්වීම<br>• සර්වනාම යෙදෙන අවස්ථා<br>• සර්වනාම, විශේෂණ නාම ලෙස යෙදෙන අයුරු<br>• නාමපද වෙනුවට සර්වනාම යෝජනය | 2.1.1<br>• සර්වනාම යනු මොනවාදැයි නිදසුන් සහිත ව පහදයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම ප්‍රකාශ කරයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී සර්වනාම යෙදෙන ආකාරය නිදසුන් සහිත ව ප්‍රකාශ කරයි.<br>• විශේෂණපද වශයෙන් සර්වනාම යෙදෙන අවස්ථා ගෙනහැර දක්වයි.<br>• නාමපද වෙනුවට සර්වනාම යෝජනය කරමින් වාක්‍යනිර්මාණය කරයි. | 15 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 2.1.2 පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග සර්ව නාම<br>• සර්වනාම ශබ්ද වරනැගීම<br>• අස්මද් ශබ්දය<br>• යුෂ්මද් ශබ්දය<br>• තද් ශබ්දය | 2.1.2<br>• වාක්‍යවල ඇති ලිඞ්ගත්‍රයට අයත් නාමපද වෙනුවට සුදුසු සර්ව නාමපද යොදයි.<br>• අදාළ ශබ්ද සැලකිල්ලට ගනිමින් දෙනු ලබන සර්ව නාම පද පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් වර්ග කරයි.<br>• අදාළ ශබ්ද සැලැකිල්ලට ගනිමින් දෙනු ලබන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග සර්වනාම පද වරනගයි. | |
| 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි. | 3.1 ආඛ්‍යාතවල ධාතු මූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය ඉස්මතු කර පෙන්වයි. | 15 |
| | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි වරනගමින් නිවැරදි ව භාවිත කරයි. | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභයපදයෙහි වරනැගීම<br>• පරස්මෛපද ප්‍රත්‍ය<br>• ආත්මනෙපද ප්‍රත්‍ය | 3.2<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද යෝජනා කරයි.<br>• ලට්, ලඞ් හා ලෝට් යන ලකාර තුනෙහි උභයපදයට අදාළ ව ධාතු වරනගයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.** | 4.1 ස්වරසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.1 ස්වරසන්ධිය<br>• ස්වරසන්ධි ප්‍රභේද<br>  • දීර්ඝසන්ධිය<br>  • ගුණසන්ධිය<br>  • වෘද්ධිසන්ධිය<br>  • ව්‍යස්තසන්ධිය<br>  • ලෝපසන්ධිය<br>  • ලෝපශ්සන්ධිය<br>  • ආදේශසන්ධිය<br>  • ආගමසන්ධිය<br>• නිර්දිෂ්ට පාඨ ඇසුරින් දෙනු ලබන ස්වරසන්ධි පද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.1<br>• ස්වරසන්ධිය සහිත වචන නම් කරයි.<br>• ස්වරසන්ධි ප්‍රභේද නම් කරයි.<br>• ස්වරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කර පෙන්වයි.<br>• ස්වරසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• ස්වරසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පාඨවලින් ස්වරසන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• ස්වරසන්ධි පද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතු කර පෙන්වයි. | 10 |
| **5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.** | 5.1 සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 5.1.1 සමාස නාමික ව හඳුන්වා දීම | 5.1.1<br>• වෙන් වෙන් ව පවත්නා නාමපද දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට එක් නාමපදයක් වන ලෙස ගැළපීමෙන් සමාස නිර්මාණය වන බව ප්‍රකාශ කරයි.<br>• පහත දක්වෙන සමාස නිදසුන් වශයෙන් දක්වයි.<br>වාචං වාචම් ප්‍රති = ප්‍රතිවාචම්<br>චීවරාය වස්ත්‍රම් = චීවරවස්ත්‍රම්<br>(සරල හා නිතර භාවිත වන නිදසුන් පමණක් දක්වීම සෑහේ.) | 10 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 5.1.2 සමාස වර්ග<br>• අව්‍යයීභාවසමාසය<br>• තත්පුරුෂසමාසය<br>• ද්වන්ද්වසමාසය<br>• බහුව්‍රීහිසමාසය<br>• කර්මධාරයසමාසය<br>• ද්විගුසමාසය<br>(ඒ ඒ සමාසවල වෙනස හඳුනා ගැනීමසඳහා පමණක් උදාහරණ භාවිත කිරීම සෑහේ.) | 5.1.2<br>• සංස්කෘත භාෂාවේ සමාසවර්ග හයක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• සමාසවර්ගහය නම් කරයි. | |
| | | 5.1.3 සමාසවල ප්‍රයෝජන<br>**ඓකපද්‍යං, ඓකස්වර්‍යං 'ඒකවිභක්තිකත්වං ච සමාසස්‍ය ප්‍රයෝජනම්.'**<br>• පද වැඩි ගණනක් එක් පදයකින් දක්විය හැකි වීම<br>• එක්පදයක් ලෙස උච්චාරණය කළ හැකි වීම<br>• එකවිභක්තියකින් අවසන් වීම | 5.1.3<br>• සමාසවලින් භාෂාවකට ඇති ප්‍රයෝජන විස්තර කරයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.** | 6.1 තද්ධිත වර්ගවලට නිදසුන් දක්වයි. | 6.1 තද්ධිත වර්ග<br>• අපත්‍යතද්ධිත - නිදෘ ගෞතම<br>• භාවතද්ධිත - නිදෘ මෘදුතා<br>• අස්ත්‍යර්ථතද්ධිත - නිදෘ ප්‍රාඥ<br>• සමූහාර්ථතද්ධිත - නිදෘ බන්ධුතා<br>• අතිශයාර්ථතද්ධිත - නිදෘ ලඝුතර<br>• අනේකාර්ථතද්ධිත - නිදෘ මාගධික<br>• සඞ්ඛ්‍යාතද්ධිත - නිදෘ දශම<br>• අව්‍යයතද්ධිත - නිදෘ උත්තර<br>(හඳුනාගැනීම සඳහා පමණක් නිදසුන් දැක්වීම ප්‍රමාණවත් ය.) | 6.1<br>• තද්ධිතවර්ග අට නම් කරයි.<br>• නිදසුන් වශයෙන් දී ඇති තද්ධිත වාක්‍යවල යොදයි. | 10 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.** | 7.1 කෘදන්ත පිළිබඳ දැනුවත් බව ප්‍රදර්ශනය කරයි. | 7.1 කෘදන්ත නාමික ව හඳුන්වා දීම<br>• ත්‍රෛකාලිකකෘදන්ත<br>• අතීතකෘදන්ත<br>• වර්තමානකෘදන්ත<br>• අනාගතකෘදන්ත<br>• අව්‍යයකෘදන්ත<br>- තුමන්තක්‍රියා<br>- පූර්වක්‍රියා<br>• භාවකෘදන්ත<br>• ස්ත්‍රීකෘදන්ත<br>(හඳුනාගැනීම සඳහා පමණක් නිදසුන් දැක්වීම සෑහේ.) | 7.1<br>• සංස්කෘත භාෂාවේ ඇති කෘදන්ත 11 අතුරින් ත්‍රෛකාලික, අතීත, වර්තමාන, අනාගත, අව්‍යය, භාව සහ ස්ත්‍රී යන කෘදන්ත හත වාචෝද්ගත ව නම් කරයි.<br>• දෙනු ලබන කෘදන්තවර්ග හත සටහනකින් ඉදිරිපත් කරයි.<br>• අව්‍යයකෘදන්තවල ප්‍රභේද දෙකක් ලෙස තුමන්තක්‍රියා සහ පූර්වක්‍රියා නම් කරයි.<br>• ඉහත සියලු ම කෘදන්ත නියමිත ප්‍රත්‍ය යෙදීමෙන් සෑදෙන ආකාරය පෙන්වයි. | 10 |
| **8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 8.1 උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 8.1 උක්තය, ආඛ්‍යාතය හා කර්මය ඇති සරල වාක්‍ය<br>• **ලට්, ලඞ්, ලෝට්** ලකාරවලට අදාළ වාක්‍ය<br>• වචනත්‍රයට අදාළ වාක්‍ය<br>• පුරුෂත්‍රයට අදාළ වාක්‍ය | 8.1<br>• උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති **ලට්, ලඞ්, ලෝට්** ලකාරවලට අදාළ සරල වාක්‍ය ලියයි.<br>• එක් ලකාරයකට අයත් සරල වාක්‍යයක් දුන් විට අනෙකුත් ලකාරවලට හරවයි.<br>• වචනත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.<br>• ඒකවචනයට අයත් සරල වාක්‍යයක් දුන් විට ද්විවචනයට සහ බහුවචනයට හරවයි.<br>• පුරුෂත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි. | 15 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වය ලබයි. | 9.1 සංස්කෘත වරනැගිල්ල පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.1 සංස්කෘත නාම වරනැගිල්ල | 9.1<br>• සංස්කෘත නාම වරනැගිල්ල වනපොත් කරයි.<br>• අන්තය අනුව වෙනස්කම් හඳුනාගෙන වරනගයි.<br>• වරනගන ලද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි. | 35 |
| | 9.2 ව්‍යාසකාරය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.2 ව්‍යාසකාරය (31 සිට අවසානය දක්වා) | 9.2<br>• ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• ව්‍යාසකරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරයෙන් ලියයි.<br>• විවිධ අවස්ථාවල දී උපදෙස් දීම සඳහා ව්‍යාසකාරය යොදා ගත හැකිබව ප්‍රකාශ කරයි. | |
| | 9.3 ප්‍රථමාදර්ශය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.3 ප්‍රථමාදර්ශය (1 සිට 15 පාඩම්) කියවීම හා පරිවර්තනය කිරීම | 9.3<br>• ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය කියවයි.<br>• ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කරයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි.** | 10.1 සංස්කෘත පාඨමාලා 03 ග්‍රන්ථය ඇසුරින් ප්‍රත්‍යශතකය රසවිඳියි. | 10.1 ප්‍රත්‍යශතකය<br>• ප්‍රත්‍යශතකයේ ( 3,7, 12, 14, 18, 22, 27, 30, 31, 33, 34, 40, 41, 43, 50, 54, 57, 58, 60, 62, 66, 69, 71, 79, 100 යන අංකවලින් දැක්වෙන ශ්ලෝක) | 10.1<br>• ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• ප්‍රත්‍යශතකය රසවිඳියි. | 40 |
| | 10.2 සංස්කෘත පාඨමාලා 03 ග්‍රන්ථය ඇසුරින් හිතෝපදේශය රසවිඳියි. | 10.2 හිතෝපදේශය<br>• හිතෝපදේශයේ ප්‍රස්තාවිකා කොටසෙහි එන ( 2, 3, 4, 6, 7, 10, 11, 12, 13, 16, 17, 18, 20, 22, 23, 24, 25, 26, 27,30, 31, 32, 33, 34, 36, 37, 38, 39, 40, 41, 42, 43, 44, 47, 48 අංක දරන ශ්ලෝක)<br>• හිතෝපදේශයේ එන කථා<br>- ආගන්තුකයකු සමග මිත්‍ර වූ මුව-කපුටු-සිවල් ආදීන් පිළිබඳ කථාව | 10.2<br>• හිතෝපදේශයේ අදාළ ගද්‍ය සහ පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• හිතෝපදේශයේ එන ගද්‍ය සහ පද්‍ය කොටස් මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• හිතෝපදේශය රසවිඳියි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | (ආගන්තුකේන සෞහාර්දෙ මෘගකාකජම්බූකකථා)<br>- නුපුරුදු කෙනකුට නවාතැන් දුන් අන්ධ ගිජුලිහිණියා බළලා හා පක්ෂීන් පිළිබඳ කථාව<br>(අපරිචිතාය වසතිදානේන්ධගෘධ්‍ර මාර්ජාරපක්ෂීකථා)<br>- අතිශයින් ලොල් වූ වැදි-මුව-ඌරු-සර්ප-සිවල් ආදින් පිළිබඳ කථාව<br>(අතිලෝභේ ව්‍යාධ-මෘග-ශූකර- සර්ප-ජම්බූකකථා) | | |

**නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (3 ශ්‍රේණිය)**

**1. නිර්දිෂ්ටග්‍රන්ථ**

- සංස්කෘත භාෂාව - 03, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ව්‍යාසකාරය (31 සිට අවසානය දක්වා)
- සංස්කෘත ප්‍රථමාදර්ශය 01 - 15 පාඩම්, විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව - 2010
- සංස්කෘත පාඨමාලා - 03, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, පැලියගොඩ - 2016
- සාරස්වත ව්‍යාකරණම් (දේවනාගරී) ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, උදය ග්‍රැපික්ස්, රත්තණපිටිය - 2016

**2. පරිශීලනීය ග්‍රන්ථ**

- සංස්කෘත අකුරු ලියමු - (01) ප්‍රාචී අධ්‍යාපන ප්‍රකාශන, (සංයුක්ත තැටිය සහිත ව)
- භාෂණසංස්කෘතම් - පූජ්‍ය උඩවෙල රේවත හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2010
- කිං සංස්කෘත භාෂයා රචනාං ලිඛාමඃ - පූජ්‍ය උඩවෙල රේවත හිමි, ආචාර්ය කේ. බී.  ජයවර්ධන, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2012
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික හා වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

**තක්සේරු හා ඇගැයීම් කාර්යය**

**පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ** පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගැනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගැනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.